# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 10
NUMBER 11

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

FEBRUARY 10, 2008 පෙබරවාරි මාසය (බුද්ධ වර්ෂ 2551 නවම් මාසය)




Photo: Chamila Karunaratne - Rivira Media - Sri Lanka

Now Lanka Viththi is on the Web. ලංකාවිත්ති වෙබ් අඩවිය
http://www. lankaheritage.com/lankaviththi/

# නිදහසට 60 පිරේ!

**සංජය විමලරත්න විසිනි**

**දි**න කීපයකට පෙර පසුවුණු පෙබරවාරි **4** වෙනිදා අප රටට නිදහස ලැබී වසර **60** ක් සම්පූර්ණ විය. අවුරුදු හැටක් යනු මිනිස් ජීවිතයක නම් උපරිම ආයුෂ වශයෙන් සැලකෙන ප්‍රමාණයෙන් හරියටම බාගයකි. පරණ මත අනුව නම් හැට පිරෙනවාය කියන්නේ මනුෂ්‍යයෙකුගේ නිර්මාණාත්මක, කාර්යක්ෂම ජීවිත කාලය අවසන් වූ සමය වශයෙනි. **හැට පිරුණු මහල්ලෙක්** යනුවෙන් හැඳින්වෙන යෙදුම ම මෙම සංකල්පයට නිදසුනකි.

නමුත් රටක ඉතිහාසය අනුව බලන විට නම් වසර හැට යනු කෙටි කාලයකි. වසර දෙදහස් පන්සීයක ටත් වැඩි අප දීර්ඝ ඉතිහාසය ගෙන බලන විට මෙය නිමේශයකි. ලෙඩ රෝග දරිද්‍රතාව ආදියෙන් පිරි එදා අපේක්ෂිත සාමාන්‍ය ආයු කාලය (life expectancy) වසර තිහ හතළිහකට වඩා වැඩි නොවී ය. ඒ සමග සසඳා බලන විට හැට යනු මහළු විය වෙයි. නමුත් අද ලෝකයේද, අපේ වුවද, එය වසර හැත්තෑව ඉක්ම වයි. ඒ අනුව වසර හැට ඇත්ත වශයෙන් මුහුකුරා ගිය අත්දැකීම් වලින් පිරි වයසක් වෙයි. කෙසේ වුවද එදා 1948 සමග අද පවතින තත්වයන් සසඳා බලා යම් සමාලෝචනයක යෙදීම වරදක් නැත.

සමාජ ආර්ථික වශයෙන් බලනවිට සංඛ්‍යාත්මක වර්ධනයක් (quantitative growth)නම් බොහෝ පැතිවලින් සිදුවී තිබේ. කාලය සමග මිනිස් සමාජයක මෙය නිරායාසයෙන්ම සිදුවේ. උදාහරණ වශයෙන්, එදා අපේ ජනගහනය මිලියන 8 ක් වීය. අද එය මිලියන 20 ක් ඉක්මවා ඇත. එසේම ජාතික දළ නිශ්පාදනය කීප ගුණයකින් වැඩිවී ඇත. බැලූ බැල්මට මෙය අති විශාල වර්ධනයකි. නමුත් ගුණාත්මක වශයෙන් සලකා බලන විට නම් එම නිශ්පාදිත ධනය සාධාරණ ලෙස බෙදී ගොස් වැඩි ජන සංඛ්‍යා අනුපාතයකට, වඩා හොඳ ජීවන තත්වයක් ඇතිවී තිබේ ද යන්න අනුව බලන විට නම් තත්වය එතරම් සතුටුදායක නැති බව කිව යුතු ය.

## නිදහස ලැබීම

1948 අපට නිදහස ලැබුණේ 1930-40 ගණන් වල භාරතයේ සිදුවූ තීව්‍ර නිදහස් අරගල වල ප්‍රතිඵලයක් වශයෙන් බ්‍රිතාන්‍යයින්ට අධිරාජ්‍යවාදී පාලනය තව දුරටත් ගෙනයාමට නොහැකි වූ බැවින් ඉතා අකමැත්තෙන් වුවද එම රට අතහැර යාමට සිදුවීම සමගය. මහත්මා ගාන්ධි ජවාහර්ලාල් නේරු වැනි දේශප්‍රේමීන්ගේ ප්‍රබුද්ධ නායකත්වය යටතේ නැගී සිටි සකල භාරතීය ජනතාව දශක කීපයක් තුළ ලේ හෙල්ලීම් යටතේ ජීවිත කැපකරමින් ගෙනගිය නිදහස් අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙය සිදුවීය. දෙවන ලෝක යුද්ධයෙන් හෙම්බත්වී සිටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට බ්‍රිතාන්‍ය කිරුළේ අග්‍ර මාණික්‍යය වශයෙන් සැලකුණ භාරතය අතහැර යාමට සිදුවූයේ කැමැත්තකින් නොවේ. ඒ ළඟම වූ අල්ලක් තරම් වන අප කුඩා රටද ඒ සමගම අතහැර යාම නුවණට හුරු බව වැටහුණ බැවින් ඔව්හු අපටද නිදහස දුන්හ. ඒ නිකම්ම නොවේ. තේ, රබර්, පොල් වැනි වටිනා කෘෂිකාර්මික නිශ්පාදනයන් පිරි මෙහි පාලන අයිතිය ඒවන විට ගොඩ නැගී සිටි, කළු සුද්දන් බවට පත්ව සිටි අධිරාජ්‍ය ගැති සිංහළ, ද්‍රවිඩ, මුස්ලිම් කණ්ඩායම් වලට හිමි කරමිනි. මේ පන්තිය බලයේ සිටින තුරා වඩා පහසුවෙන් සිය ආධිපත්‍යය පවත්වාගෙන යා හැකි බව හොඳින් පෙනුණු නිසාය.

එදා ඉංග්‍රීසි පාලන බස විය. ඉහළ නාගරික ජනසමාජය ඉංග්‍රීසියෙන්ම ජීවත්වූ කළු සුද්දන්ගේ සමාජයක් විය. සිංහළ සහ දෙමළ භාෂා සේවක සේවිකාවන්ගේ හා ගොඩයින්ගේ බස වීය. සිංහළ හෝ දෙමළ පමණක් උගතාට යා හැකි උපරිම දුර වූයේ වෙද මහතෙකු පාසැල් ගුරුවරයෙකු හෝ ගම්මුලාදෑනියෙකු වැනි තැනකටය. ඉංග්‍රීසිය අමාරුවෙන් හෝ උගත් අයෙකු ජොෂ්ඨ විභාගය සමත්ව ලිපිකාර සේවය, තැපැල් සේවය වැනි මධ්‍යම මට්ටමේ රැකියාවලටය.

පන්ති භේදය මෙන්ම කුල භේදයද ඉතා විශාල ලෙස පැවතිණ. විශාල ඉඩම් හිමි වැවිලිකරුවෝද පාලක පන්තියට ළංව සුද්දා යටතේ කළ ආකාරයෙන්ම සාමාන්‍ය ජනතාව ප්‍රවේණි දාස මට්ටමට දමා සලකමින් කටයුතු කළෝය. එකම විශ්වවිද්‍යාලයේ ඉගෙනීම් අවස්ථාද එම ඉහළ පන්තියේ අයට පමණක් සීමාවිය. පොදු ජන බලාපොරොත්තු පිබිදීමත් සමග මේ තත්වයන් ක්‍රමයෙන් වෙනස්වන්නට පටන් ගැනුණි. පසුගිය හැට වසරේ සිදුවූ වෙනස්වීම් වල ස්වභාවය අනුව දළ වශයෙන් යුග දෙකකට බෙදිය හැක.

## පළමු තිස් වසර 1948 -1978

මේ තිස් වසර තුළ නිදහසේ ඵල ලබාගනුවස් ජන පිබිදීම් විය. යටත් විජිත නශ්ඨාවශේෂ වශයෙන් ඉතිරිවුණු සුද්දන්ට අයිතිව තිබූ තේවතු, ත්‍රිකුණාමල වරාය ආදිය මුදවාගනු ලැබිණ. සිංහල සහ දෙමළ දෙවන රාජ්‍ය භාෂාව වශයෙන් ස්ථාපනය කරලමින් ඉංග්‍රීසියේ ආධිපත්‍යය බිඳලිණ. මෙය 1956 න් පසු මහත් ආන්දෝලනයට තුඩුදුන් කරුණක් විය. බෙදා පාලනය කිරීමේ අධිරාජ්‍ය පිළිවෙත යටතේ සුද්දා ද්‍රවිඩ ප්‍රභූ පන්තියට දී තිබූ වරප්‍රසාද රාජ්‍ය භාෂාව වෙනස් වීම සමග ඔවුන්ගෙන් ගිලිහිණ. එය පොදු ජනතාවට සිය හිමි තැන ලබාදීමක් වශයෙන් නොසැලකූ ද්‍රවිඩ දේශපාලනඥයින් විසින් එය වර්ගවාදී ගැටුම කට හරවන ලදී. ඉංග්‍රීසිය නැතිවීම නිසා සිය වරප්‍රසාද නැති වූ අධිරාජ්‍ය ගැති පන්තිය සහ

5 වන පිටුව බලන්න →

එක් ලෙස පවතිනා ලෙස දකුණද උතුරු
නික් මෙන වෙඩි සැරෙන් වැනසෙයි බල සතුරු
දැක් වා යොවුන් තෙද සිහරද ලෙස කෙසරු
ලක් මව රකින් පුත! නුඹෙ පණනල අයුරු

♦ දයා ආනන්ද රණසිංහ


